DOI: 10.31357/fhssphd.2012.00095

# සූත්‍ර හා විනය පිටකයන්හි පැනෙන
# ජනප්‍රිය පූජා චාරිත්‍ර ධර්ම පිළිබඳ
# විචාර පූර්වක අධ්‍යයනයක්

දර්ශනපති
අඹන්පොළ සීලරතන හිමි

06 JAN 2012
(viva was held)

ශාන්ති විහාරය
නුවර පාර
කැලණිය
ලි. ප. අංකඃ GS/Ph.D/BP/3723/09

දර්ශනසූරි උපාධි පරීක්ෂණය සඳහා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයට

ඉදිරිපත් කෙරෙන නිබන්ධය යි.

2011

අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය, ආචාර්ය නායිම්බල ධම්මදස්සි හිමියන්ගේ සහ මහාචාර්ය ආනන්ද ගුණසිංහ මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

අපේක්ෂක

උපදේශකවරුන්ගේ සහතික

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

උපදේශක - 1

ආචාර්ය නායිම්බල ධම්මදස්සි හිමි

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

උපදේශක - 2

මහාචාර්ය ආනන්ද ගුණසිංහ

# පටුන


අපේක්ෂකයාගේ ප්‍රකාශය හා

උපදේශකවරුන්ගේ සහතිකය ii

සමර්පණය vii

උපකාරානුස්මෘති viii

හැඳින්වීම x

නිබන්ධ සාරාංශය xvii

1 පරිච්ඡේදය

සාහිත්‍යයික මූලාශ්‍රය විමර්ශනය 1

2 පරිච්ඡේදය

ආගම හා පුද-පූජා විධි 19

2. 1. ආගම හැඳින්වීම

2. 2. ආගම, ඇදහිලි-විශ්වාස හා පුද-පූජා විධි

2. 3. ආගම්වල එන ඇදහිලි හා පූජා විධි
අතර ඇති සමානකම් හා අසමානකම්

2. 4. ආගම හා අභිචාර

2. 5. බුදු දහම හා පුද-පූජා විධි

2. 6. ආගම හා පුද-පූජා මගින් මානව සමාජයට
ඉටු කෙරෙන කාර්යභාරය

3 පරිච්ඡේදය

සූත්‍ර හා විනය පිටකයන්හි පැනෙන අන්‍ය සාමයික ඇදහිලි,
පූජා චාරිත්‍ර විධි හා ඒවා පිළිබඳ බෞද්ධ විචාරය,
සංශෝධන හා නව අර්ථකථන 46

3. 1. හැඳින්වීම

3. 2. 1. වෛදික දේව සංකල්පය

3. 2. 2. වෛදික දේව සංකල්පය
බුදුන් වහන්සේගේ විවේචනයට ලක්වූ අයුරු

3. 2. 2. 1. ශක්‍ර දේවේන්ද්‍රයා

3. 2. 2. 2. මහා බ්‍රහ්මයා

3. 2. 2. 3. යම රජු

3. 2. 2. 4. මාර සංකල්පය

3. 3. බෞද්ධ දේව ලෝක සංකල්පය

3. 4. 1. බ්‍රාහ්මණ යාගය හා ඒ පිළිබඳ
බුදුන් වහන්සේගේ විවේචන හා සංශෝධන

3. 4. 2. බ්‍රාහ්මණ උදක ශුද්ධිය හා ඒ පිළිබඳ
බෞද්ධ විවේචන හා සංශෝධන

3. 4. 3. බ්‍රාහ්මණ ශ්‍රාද්ධය හෙවත් පිතෘ පූජාව,
ඒ පිළිබඳ බෞද්ධ විවේචන හා සංශෝධන

3. 5. බ්‍රාහ්මණ රක්ෂණ මන්ත්‍ර හා බෞද්ධ පරිත්ත

3. 6. බ්‍රාහ්මණ ආගමික සදිසා වන්දනාව හා
බෞද්ධ සදිසා වන්දනාව

4 පරිච්ඡේදය

පැවිදි සංස්ථාව සහ තදනුබද්ධ පූජා චාරිත්‍ර ධර්ම 97

4. 1. විෂයානුබද්ධ පසුබිම

4. 2. බෞද්ධ ප්‍රව්‍රජ්‍යාවේ ආරම්භය හා විකාශය

4. 2. 1. පබ්බජ්ජාව

4. 3. බෞද්ධ භික්ෂු සමාජයේ සමූහවාසය ආරම්භවීම, වර්ධනයවීම
සහ එහි වත්-පිළිවෙත් හා පූජා චාරිත්‍ර පහළවීම

4. 3. 1. වස්සාවාස

4. 3. 2. උපසම්පදාව

4. 3. 3. පවාරණ උත්සවය

4. 3. 4. කඨින චීවර පූජා උත්සවය

4. 4. උපොසථ චාරිත්‍රය හා පාතිමොක්ඛුද්දේසය

5 පරිච්ඡේදය

ගෘහස්ථ සංස්ථාව ආශ්‍රිතව පහළ වූ පූජා චාරිත්‍ර 146

5. 1. හැඳින්වීම

5. 2. දානය

5. 2. 1. දානයේ ප්‍රභේද

5. 2. 2. දානයේ ඇති විශිෂ්ටත්වය

5. 2. 3. දන් දීමේ ක්‍රමය

5. 2. 4. දානය පූජා විධියක් ලෙස හැඩ ගැසුණු අයුරු

5. 3. සීල හැඳින්වීම

5. 3. 1. ගිහියන්ගේ උපෝසථ සීල සමාදානය

5. 3. 2. සීලයේ ආනිශංස

5. 4. භාවනාව

5. 5. ගෘහස්ථ බෞද්ධයාට බුදු දහමේ
නිර්දේශිත වන්දනා ක්‍රම

5. 5. 1. චෛතිය වන්දනා

5. 5. 2. බෝධි පූජාව

5. 5. 3. බෝධියට කළ වත්-පිළිවෙත්

6 පරිච්ඡේදය

ජනප්‍රිය බුදු දහමේ පූජා විධීන්ගේ වර්ධනය හා විකාශය 190

6. 1. හැඳින්වීම

6. 2. ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව

6. 3. චේතිය හා තදාශ්‍රිත පූජා චාරිත්‍ර

6. 3. 1. මහාථූපයේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපන උත්සවය

6. 3. 2. මහාථූපයේ සර්වඥ ධාතු නිධානෝත්සවය

6. 3. 4. චේතිය හා සම්බන්ධ පුෂ්ප පූජා

6. 3. 5. චේතිය හා සම්බන්ධ ගිරිභණ්ඩ පූජා උත්සවය

6. 4. පාරිභෝගික චේතිය පූජාව සහ එහි විකාශය

6. 4. 1. බෝධි පූජාව වටා එක්වූ අභිචාර විශ්වාස හා චාරිත්‍ර

6. 5 උද්දේසික චේතිය පූජාව හා තදාශ්‍රිත ඇදහිලි විශ්වාස

6. 5. 1. බුදුපිළිම හා තදාශ්‍රිත බුද්ධපූජා හා උත්සව

6. 5. 2. නේත්‍ර ප්‍රතිෂ්ඨාපන මංගල්‍යය

6. 5. 3. බුදුපිළිම නෑවීමේ මංගල්‍යය (නානුමුර මංගල්‍යය)

7 පරිච්ඡේදය

බෞද්ධ පූජා චාරිත්‍රවල ආචාර විද්‍යාත්මක හා
මනෝ විද්‍යාත්මක පසුබිම 221

නිගමනය 257

සංකේත නිරූපණ සහිත ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 261

සූචිය 273

## සමර්පණය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය,
මා මෙලොවට බිහි කොට
සෙනෙහසින් මා ඇති දැඩි කළ
මෑණියන්ට හා
මට හොඳ නරක කියා දුන් පියාණන්ට ද,

අස්මදාචාර්ය,
අපවත්වී වදාළ,
ගාලු පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක,
ගිනිවැල්ල නව මුනි සෑ විහාරාධිපති,
රාජකීය පණ්ඩිත, සාහිත්‍යාචාර්ය, දර්ශනපති,
මීගොඩ කල්‍යාණතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේට ද
සමර්පණය කෙරෙන වග යි

## උපකාරානුස්මෘති

මෙම නිබන්ධය සම්පාදනය කිරීමේ දී නන් අයුරින් උදව් උපකාර කළ හිතවත්තු බොහෝ දෙනෙක් වෙති. ඒ සියලු දෙනාම කෘතවේදී ව සිහිපත් කෙරෙන අතර, ඉන් කිහිප දෙනෙකු ගැන මෙහි ලා සඳහන් කිරීම මගේ යුතුකමක් කොට සලකමි.

මෙම නිබන්ධයේ දී මාගේ උපදේශකවරුන් ලෙස ක්‍රියා කරමින් මට අවශ්‍ය මහගු උපදෙස් දෙමින්, සෙනෙහසින් මා මෙහෙයවූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය නායිම්බල ධම්මදස්සි හිමිපාණන් වහන්සේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ, හිටපු මහාචාර්ය ආනන්ද ගුණසිංහ විද්වතාණන් ස්තුති පූර්වක ව පළමුව සිහිපත් කිරීමට කැමැත්තෙමි.

මෙ වැනි අධ්‍යයනයක අවශ්‍යතාව මට පෙන්වා දෙමින් හා මා දිරිගන්වමින්, මෙම පර්යේෂණය කරගෙන යාමට මට අවශ්‍ය මානසික නිදහස ලබාදුන් කැලණිය ශාන්ති විහාරාධිකාරී, විශ්‍රාමලත් පරිවෙණාචාර්ය, කොටවිල ජනානන්ද හිමිපාණන් වහන්සේ, අනුරාධපුර බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යාය, වාරියපොළ ශ්‍රී සුමංගල විශ්වවිද්‍යාලය පිරිවෙනේ කෘත්‍යාධිකාරී, මහාචාර්ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ හිමිපාණන් වහන්සේ, දහරවියේ දී මා හික්මවා ශාස්ත්‍රීය කටයුතු කෙරෙහි යොමු කළ, මාතලේ-කපුකොටුව ශාන්තිනිකේතන පිරිවෙන්පති, අපවත් වී වදාළ, රාජකීය පණ්ඩිත අඹන්පොළ ශ්‍රී ඤාණවිමල හිමිපාණන් වහන්සේ, මාගේ ප්‍රිය ශිෂ්‍ය, කොළඹ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන, හේනේපොළ ඉන්දරතන නම සහ කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක මුරුත්තෙට්ටුවේ ඉන්දරතන නම ද, ගෞරව පූර්වක ව සිහිපත් කරමි.

මගේ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ පොත් පත් සපයා දීමෙන්, නන් අයුරින් මට උදව් උපකාර කළ කැලණිය විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති අබේරත්න සමරකෝන් මහතා සහ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ විශ්‍රාම ලත් පුස්තකාලයාධිකාරී, ඔලී රණසිංහ මහතා ද මෙහි ලා ස්තුති පූර්වක ව සිහිපත් කරමි. පුද-පූජා විධිවල ආචාරවිද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක

ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා නන් අයුරින් උපකාර කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය ඤාණදාස පෙරේරා මහතා ද මෙහි ලා කෘතවේදී ව සිහිපත් කරමි.

මෙම අධ්‍යයන කාර්යයේ දී මට සහාය වූ කොළඹ උතුර, අගමැති විද්‍යාලයේ විදුහල්පතිනි දමයන්ති ගුණරත්න මැණිකේ මහත්මිය ඇතුළු ඇදුරු කැළට මගේ කෘතඥතාව හිමි වේ. මෙම අධ්‍යයනයේ දී මා දිරිමත් කළ, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ, හිටපු ආචාර්ය එච්. එල්. එස්. අභයසිංහ මහතාට සහ කැලණිය ශාන්ති විහාරයේ කාර්ය මණ්ඩලයේ නියුතු, සම්පත් ජයන්ත කෝදාගොඩ, අබේකෝන්, ශාන්ත, පතිරණ හා නිශාන්ත යන අය ද මෙහි ලා සෙනෙහසින් සිහිපත් කරමි. මෙම නිබන්ධය පරිගණක වර්ණ සංයෝජනය කිරීමේ දී මහත් කැපවීමෙන් ක්‍රියා කළ අරුණ තලගල මහතාට ද මගේ කෘතඥතා පූර්වක ස්තුතිය මෙහි ලා පිරිනැමේ.

අඹන්පොළ සීලරතන

# හැඳින්වීම

බුදු දහම ලොව පහළ වූයේ, එතෙක් භාරතයේ ප්‍රචලිත ව පැවති ආගමික, දාර්ශනික හා අධිභෞතික චින්තාවන්ට ඉඳුරා ම පටහැනි වූ, නව්‍යතම දාර්ශනික පසුබිමක් ඇති දහමක් හැටියට ය. බුදුරජාණන් වහන්සේ තමන් අවබෝධ කොටගත් දහම හඳුන්වා දෙන ලද්දේ, පෙර නො ඇසූ විරූ දහමක් (පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු) ලෙස ය. එම දහමෙහි මූලික පරමාර්ථය වූයේ, පුද්ගලයාට සසර දුකින් මිදී විමුක්තිය සලසා ගැනීමට මග පහදා දීම ය. විමුක්ති පරමාර්ථ සාක්ෂාත්කරණය සඳහා කවරාකාර වූ හෝ දෙවියකුගේ සරණ පැතීමට හෝ යාග-හෝම, පුද-පූජා ආදී අභිචාර විධීන්හි පිහිට පැතීමට හෝ අවශ්‍ය නො වේ. එයට ඒකායන මාර්ගය වන්නේ, ආර්ය අෂ්ටාංගික මාර්ගය පෙරටු කොට ගත් අනුපූර්ව ප්‍රතිපදාව අනුගමනය කිරීම ය. මුල් බුදු දහමෙහි යාග-හෝම, පුද-පූජා ආදිය සලකන ලද්දේ, පුද්ගලයාගේ විමුක්තියට බාධා පමුණුවන, ප්‍රඥාව දුබල කරන (පඤ්ඤාය දුබ්බලීකරණ) දෑ හැටියට ය. ඒ අනුව, සමකාලීන බ්‍රාහ්මණ ආගමේ ව්‍යවහෘත ව පැවති දෙවියන් පිළිබඳ විශ්වාසය මෙන් ම, ඒ වටා සංකේන්ද්‍රිත යාග-හෝම, පුද-පූජා ආදිය ද අර්ථ විරහිත නිෂ්ඵල ක්‍රියා සේ සලකන බුදු දහම ඒවා නිර්දය විචාරයට ද ලක් කරයි.

වෙනත් වදනකින් කිවහොත්, බුදු දහම වූකලී යථාර්ථවාදී, මනෝ විද්‍යාත්මක හා ඥාන මීමංසාත්මක චින්තනයකි. එහි දී "යථාභූත ඤාණ දස්සනය" හෙවත් ඇත්ත ඇති සැටියෙන් දැකීමට සුවිශේෂී තැනක් හිමි වෙයි. ලොව පිළිබඳ ඇත්ත ඇති සැටියෙන් දැකීමට අපොහොසත් වීම නිසා මිනිසා තුළ තෘෂ්ණාදී අනේකවිධ ක්ලේශ ධර්ම ජනිත වන බව පවසන බුදු දහම එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයාගේ අඛණ්ඩ සාංසාරික පැවැත්ම ද සිදුවන බව පෙන්වා දෙයි (තණ්හා ජනෙති පුරිසං). එමෙන් ම තෘෂ්ණාව නැති කිරීමෙන් සාංසාරික පැවැත්ම කෙළවර කර ගැනීමට හැකි බවත් (තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණං), එසේ එය කෙළවර කර ගත හැකි වනුයේ, ලොව ඇති සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීමට තුඩු දෙන යථාභූත ඤාණ දස්සනය උපදවා ගැනීමෙන් පමණක් බවත් පෙන්වා දෙයි. මේ ආකාරයට ආත්ම-ඊශ්වර වැනි කවරාකාර වූ හෝ පාරභෞතික සංකල්පවලින් තොර ව පුද්ගලයා හා ඔහුට සාපේක්ෂක ලෝකයේ

යථා ස්වභාවය විග්‍රහ කරන මුල් බුදු දහම වූකලී දෙවියන් පිළිබඳ විශ්වාසය හා යාග-හෝම පුද-පූජා ආදී අභිචාරමය චාරිත්‍ර විධි සම්පූර්ණයෙන් ම බැහැර කිරීම අරමුණු කොට ගෙන පහළ වූ දහමකි.

ඒ හැරත්, විචාර පූර්වක චින්තනය ඉමහත් සේ අගය කරන මුල් බුදු දහම අන්ධ භක්තිය, ඇදහිලි, විශ්වාස ආදිය මගින් කිසිසේත් ම ආධ්‍යාත්මික පිරිපුන් බව සපුරා ගත නො හැකි බව පුන පුනා අවධාරණය කරන්නකි. බෞද්ධයාගේ මුඛ්‍යතම අරමුණ වූ නිර්වාණ සාක්ෂාත්කරණ ප්‍රතිපදා මාර්ගයෙහි කවරාකාර වූ හෝ වන්දන-මානන, පුද-පූජා චාරිත්‍ර ආදී දැයට කිසිදු තැනක් හිමි වී නැත. 'සීලබ්බත පරාමාස' ලෙස දැක්විය හැකි එකී සියලු අභිචාර විධි බුදුන් වහන්සේ සපුරා බැහැර කළහ. බාහිර වන්දනාව හා ක්‍රියාකාරකම්වලට වඩා පුද්ගල සන්තානගත පාරිශුද්ධියටත්, ආර්ය සත්‍යාවබෝධයටත් මග පෙන්වන බුදු දහම මානව කේන්ද්‍රීය වූවකි. දෘෂ්ටිග්‍රහණයෙන් හා ද්වන්ද්වචරණයෙන් තොර වූ බුදු දහම ශෛලිගත චරණ ධර්ම පද්ධතියක් නො වන බවත්, බුදුරදුන් පළ කළ ආර්ය මාර්ගයෙහි කිසිදු තැනක පුද-පූජා ක්‍රම සඳහන් කොට නැති බවත්, පුද-පූජා පැවැත්වීම ප්‍රකට වශයෙන් දක්නට ලැබෙනුයේ 'ආගම' යන්නෙන් හඳුනා ගෙන ඇති අධිභෞතික බලවේග කේන්ද්‍ර කොට ගත් ඇදහිලි විශ්වාස සහිත මානව චර්යා ධර්මයක් තුළ බවත්, ඩබ්ලිව්. එස්. කරුණාරත්න අවධාරණය කරයි.[1]

බුදුරදුන් ධරමාන කාලයේ දී, තත්කාලීන බ්‍රාහ්මණ ආගමේ හා සමාජයේ ජනප්‍රිය ව පැවති ඇතැම් ආගමික සංකල්ප විෂයෙහි නව අර්ථකථන ඉදිරිපත් වූ ආකාරය සූත්‍ර පිටකයේ හා විනය පිටකයේ එන තොරතුරුවලින් ප්‍රකට වේ. උදාහරණයක් වශයෙන් එකල සමාජයේ බමුණන් විසින් සතුන් මරා කරන ලද යාග-හෝමවල නිරර්ථකභාවය පෙන්වා දී, එබඳු යාග වෙනුවට පුද්ගලයාගේ ආධ්‍යාත්මික ගුණවගාවේ වර්ධනයට ඉවහල් වන දානය නම් වූ පූජා විධිය බුදුරදුන් විසින් හඳුන්වා දීම දැක්විය හැකි ය. මේ ආකාරයට ම ආගමික හා ලෞකික පරමාර්ථ පෙරදැරි කොට ගෙන බුද්ධකාලීන සමාජයේ බහුල ව පැවැත්වුණු ශ්‍රාද්ධය, පිතෘ පිණ්ඩ දානය, උදක ශුද්ධිය ආදී බොහෝ බ්‍රාහ්මණ ආගමික පූජා චාරිත්‍රවිධිවල නිරර්ථකභාවය පෙන්වා දී ඊට වඩා තාත්වික වූත්, යථාර්ථවාදී වූත්, සදාචාර ප්‍රතිපදා මගක් බුදු සමයෙන් නිර්දේශිත වූ බව පෙනේ.

කෙසේ වෙතත් කාලයාගේ ඇවෑමෙන් බාහිර ආගමික පූජා චාරිත්‍ර රැසක් බෞද්ධ සංස්කෘතික සන්දර්භයට ද ප්‍රවේශගත කරන ලද බව පෙනේ. ඒවා අතර බුද්ධ පූජා, ආරාම පූජා, චීවර පූජා, කඨින පූජා, ධාතු පූජා, බෝධි පූජා ආදිය ප්‍රධාන වේ. එහෙත් මෙ බඳු බාහිර පූජා චාරිත්‍ර හා ශ්‍රාවක අධ්‍යාත්මික පරමාර්ථ අතර සබඳතාවක් නැති තරම් ය. සැබවින් ම මේ බාහිර පූජා පිළිවෙත් බුදු සමයට ඇතුළු වී ඇත්තේ, ගිහි අනුගාමිකයන්ගේ අවශ්‍යතාවන් සඳහා බව පෙනේ. ගිහි අනුගාමිකයන් වෙනුවෙන් මෙ බඳු පිළිවෙත් බුදු සමයට ඇතුළත් කර ගැනීමට තුඩු දුන් හේතුවක් ද ඇත. එ නම්, විමුක්තිය සඳහා අනුගමනය කළ යුතු යයි බුදුන් වදාළ අරි අටඟි මග පෙරටු කොට ගත් ප්‍රතිපදා මාර්ගය පහසුවෙන් අනුගමනය කළ හැකි වූයේ, අගාරික ජීවිතයෙන් නික්ම, අනගාරික ජීවිතයට පත් පැවිද්දන්ට පමණක් වීම ය. ගිහි ජීවිතය සම්බාධ සහිත බවත් කෙලෙස්වලට ආයතනයක් බවත්, පැවිද්ද එළිමහනක් මෙන් නිදහස් බවත් (සම්බාධො'යං සරාවාසො, අබ්භොකාසො'ව පබ්බජ්ජා), බුදු දහම අවධාරණය කරයි. ඒ බව සනාථ කෙරෙන දේශනා පාඨ රැසක් සූත්‍ර පිටකයේ මෙන් ම විනය පිටකයේ ද ; ek ks a: ek oel ks y el sh [2]

සම්බාධ සහිත සංකීර්ණ ජීවිතයක් ගත කරන ගිහියාට අනුපූර්ව ප්‍රතිපදා මාර්ගය අනුගමනය කොට විමුක්තිය සාක්ෂාත් කර ගැනීම තරමක් දුෂ්කර කාර්යයක් බව බුදුන් වහන්සේ ද දැන සිටියහ. ඒ නිසා උන්වහන්සේ ගිහියන්ට ධර්ම දේශනා කිරීමේ දී ඔවුන්ගේ බුද්ධිමය හා මනෝවිද්‍යාත්මක අවශ්‍යතාවනට අනුරූප වූ දේශනා මාර්ගයක් ද අනුදැන වදාළහ. මේ දේශනා මාර්ගය බුදු සමයෙහි හැඳින්වෙන්නේ 'සාමුක්කංසිකා ධම්ම දෙසනා' යනුවෙනි. මෙම දේශනා ක්‍රමයේ ලක්ෂණය වූයේ, ධර්මය අසන පුද්ගලයාට මුලින් ම දන් දීමේ ආනිසංස හා සිල් රැකීමේ ආනිසංස පහදා දී, ඉන් පසු ඔහු ස්වර්ග සැපතට යොමු කොට, ඉන් පසු ස්වර්ගයේ ඇති අනිත්‍ය ස්වභාවය පෙන්වා දී ඔහුගේ සිත නෙක්ඛම්මය දෙසට හෙවත් ගිහි ගෙයින් නික්මීම දෙසට යොමු කරවා, ඉන් පසු පැවිද්දේ ආනිසංස දක්වා ක්‍රමානුකූලව ඔහු විමුක්තිය දෙසට යොමු කරවීම යි.[3] විමුක්තිය සඳහා අනුගමනය කළ යුතු යයි බුදුරදුන් වදාළ අනුපූර්ව ප්‍රතිපදාවේ ඒකායන අරමුණ වන්නේ, නිර්වාණ සාක්ෂාත්කරණය මිස ස්වර්ග සම්පත් ලබා ගැනීම නොවේ. නිවන ලෝකයේ ඇති උතුම් ම සැපත වේ.[4] එහෙත් නිවන් පසක් කර ගැනීමේ ඒකායන මාර්ගය වූ මේ අනුපූර්ව ප්‍රතිපදා මාර්ගය තුළ ස්වර්ග ලෝකවල උපතට ද වැදගත් තැනක් දී තිබේ. මේ ස්වර්ග ලෝකවල

ගිහියන්ට උපත ලැබිය හැක්කේ, මෙලොව දී පින් රැස් කර ගැනීම මගිනි. එසේ පින් රැස් කර ගැනීමට අවශ්‍ය වූ දානධර්මාදී පූජා ක්‍රම රැසක් බුදු සමයෙහි ප්‍රචලිත ව ඇත.

මේ අන්දමට එක් අතකින් අගාරික ජීවිතයක් ගත කරන ගිහි අනුගාමිකයන් වෙනුවෙන් බුදු දහමෙහි ජනප්‍රිය පූජා චාරිත්‍ර විධි හැඩගැසී එද්දී, අනික් අතින් භික්ෂු සංඝයාගේ ආරාමික ජීවිතය සම්බන්ධ කර ගෙන ආරාමික වත්-පිළිවෙත් හා පූජා චාරිත්‍ර විධි සමූහයක් ද කරළියට පිවිසි බව විනය පිටකයෙහි එන තොරතුරුවලින් අනාවරණය වේ.

භික්ෂු ජීවිතය ආරම්භ වූයේ, අගාරික ජීවිතයෙන් නික්ම අනගාරික තත්වයට පත්ව, කසාවත් හැඳ, පිඬු සිඟා වඩින, තාපස සම්ප්‍රදායක් හැටියට ය. මේ තාපස අවස්ථාවේ දී භික්ෂු සංඝයා අතර, නිලතල සහිත සංවිධානයක් හෝ වත් පිළිවෙත් හෝ පූජා චාරිත්‍ර විධි හෝ තිබුණේ නැත. එවකට භික්ෂු සමාජය නියෝජනය කරන ලද්දේ, ලෝකය අත් හැර සමාජ බන්ධනවලින් හා ගෘහ බන්ධනවලින් ඈත් වූ, පරිපූර්ණ බ්‍රහ්මචරිය වාසය මගින් ඉක්මණින් නිවන් පසක් කර ගැනීමට සිත් යොමු කළ භික්ෂු පිරිසක් විසිනි. එහෙත් භික්ෂු සංස්ථාවේ දේශ-කාල පරිණාමයත් සමග ආරාමික සංවිධාන ක්‍රමය කේන්ද්‍ර කොටගත් අර්ධ මාසික උපෝසථ උත්සව හා චීවර පූජා ආදී වත්-පිළිවෙත් රැසක් ම කාලයාගේ ඇවෑමෙන් භික්ෂු සමාජයෙහි ප්‍රචලිත වූ බවට බොහෝ තොරතුරු විනය පිටකයේ අන්තර්ගත ය. ඒ අනුව ආරාම පිළිගැනීම අනුදැනීමත් සමග 'ආරාම පූජා' සංකල්පය ද පැතිර ගියේය. බුදුරදුන්ට පවා වේළුවනාරාම, ජේතවනාරාම ආදි සුවිශාල ආරාම පූජා කරනු ලැබුණි. භික්ෂූන් සීලාදි ගුණ සම්පත්තියෙහි පිහිටා ක්‍රියා කිරීම අනිවාර්ය වූ අතර, භික්ෂුවට සිවුපසයෙන් සංග්‍රහ කිරීම පරමාර්ථ කොට ගෙන දාන පූජා, චීවර පූජා, ආවාස පූජා, ගිලානපච්චය භෙසජ්ජ හා විවිධ-විචිත්‍ර පරිෂ්කාර පූජා ආදී සංකීර්ණ පූජා විධි රැසක් ද ප්‍රචලිත වන්නට විය. මේ අනුව බලන විට බුදු දහම ලොව පහළ වූයේ, සසර දුකින් මිදීම කැමති වන්නවුන්ට ඒ සඳහා අනුගමනය කළ යුතු අනුපූර්ව ප්‍රතිපදා මාර්ගයක් නිර්දේශ කරන්නාවූ දහමක් වශයෙන් වුවද, බුදුරදුන් ධරමාන යුගයේ දී ම ජනප්‍රිය පුද-පූජා විධි රැසක් ම ආරම්භ වූ බව පෙනේ. එකී පුද-පූජා චාරිත්‍ර ධර්ම සමුදාය අගාරික ජීවිතයක් ගත කරන ගිහියන්ට එක් ආකාරයකිනුත්, අනගාරික ජීවිතයක් ගත කරන පැවිද්දන්ට තවත් ආකාරයකිනුත් ලෙස ප්‍රචලිත වූ බව ද පැහැදිලි ය. ගිහි සමාජයට නිර්දේශිත පුද-පූජා චාරිත්‍ර ධර්ම, බෞද්ධ විමුක්ති මාර්ගයට

පිවිසීමේ ප්‍රවේශක දොරටුවක් ලෙස දැක්වීම වඩාත් යුක්ති යුක්ත ය. පැවිදි සමාජයෙහි දේශ-කාල පරිණාමයත් සමග කරළියට පිවිසි උපෝසථකරණ ආදිය හා සබැඳි පුද-පූජා චාරිත්‍ර ධර්ම කේන්ද්‍රීය වශයෙන් ම භික්ෂූන් වහන්සේලාගේ ප්‍රායෝගික ශික්ෂණ මාර්ගයට අනුබද්ධ ව ක්‍රියාවට නැංවූ දැ බව නිර්ණය කිරීම ද වඩාත් ම සුදුසු ය. ඒ අනුව බලන විට පුද-පූජා චාරිත්‍ර ධර්මයන්ට මූලික බෞද්ධ ප්‍රතිපදා මාර්ගයෙහි කිසිදු ඉඩක් නොමැති වුව ද, බුදු සසුනෙහි දේශ-කාල පරිණාමයත් සමග කාලීන අවශ්‍යතා පදනම් කොට ගෙන ඒවා කරළියට පිවිසි බව නිගමනය කිරීම යුක්ති යුක්ත වෙයි.

## අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය

සූත්‍ර හා විනය පිටකයන්හි පැනෙන, අන්‍ය සාමයික පූජා චාරිත්‍ර විධි ගවේෂණය කිරීමත්, ඒ පිළිබඳ බෞද්ධ විචාරය හා සංශෝධනාත්මක ආකල්පය විමර්ශනය කිරීමත්, බුදු දහමට පමණක් ම ආවේණික වූ පූජා චාරිත්‍ර විධි හඳුනාගැනීමත් මෙම අධ්‍යයනයෙහි විෂය ක්ෂේත්‍රය වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

- සූත්‍ර හා විනය පිටකාගත පුද-පූජා චාරිත්‍ර ධර්ම හා තදායත්ත සංකල්ප නිර්වචනය කිරීම හා විශ්ලේෂණය කිරීම.

- පුද-පූජා චාරිත්‍ර ධර්ම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා සමය දාර්ශනික මතවාද විමර්ශනය කිරීම.

- පූජා චාරිත්‍ර ධර්ම පිළිබඳ ඓතිහාසික මූලාශ්‍රය ආශ්‍රිත කරුණු විශ්ලේෂණය කිරීම.

- පූජා චාරිත්‍ර විධි හා තදායත්ත සංකල්ප පිළිබඳ බෞද්ධ ආකල්පය තුලනාත්මක හා විචාරාත්මක පදනමකින් විශ්ලේෂණය කිරීම.

- පූජා චාරිත්‍ර විධි කෙතෙක් දුරට බෞද්ධ චින්තන සම්ප්‍රදායාගත දාර්ශනික මූල ධර්ම හා ශික්ෂණ විධීන්ට අනුගත වේදැ යි විචාර පූර්වක ව විමසීම ද මෙම පර්යේෂණයේ ක්‍රම වේදය වේ.

අධ්‍යයනයේ වැදගත්කම

1. මානව චින්තන ඉතිහාසයෙහි පූජා චාරිත්‍ර විධීන්ට හිමි වූ තැන නිර්ණය කිරීමට මහගු උපකාරයක් වීම,

2. බෞද්ධ චින්තාවෙහි ආගමික අංශය සමර්ථනය කිරීමේ දී, පූජා චාරිත්‍ර විධි කෙතෙක් දුරට උපයෝගී කොට ගත හැකි වේදැ යි නිර්ණය කර ගත හැකි වීම,

3. පූජා චාරිත්‍ර විධීන්හි මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක පදනම බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කිරීමට ඉඩ ප්‍රස්තා ලැබීම,

4. බෞද්ධ චින්තාවේ ප්‍රායෝගික අංශය හා සදාතන අගය නිර්ණය කිරීමේ දී, පූජා චාරිත්‍ර අංශය කෙතෙක් දුරට උපයෝගී කොට ගත හැකි වේදැ යි පිරික්සීමට ඉඩ ප්‍රස්තා ලැබීම,

5. අන්‍ය සාමයික පූජා චාරිත්‍ර ධර්ම විෂයෙහි බෞද්ධ චින්තාගත සංශෝධනාත්මක ආකල්පය නිර්ණය කළ හැකි වීම,

6. බෞද්ධ චින්තනයෙහි සදාචාර, ආගමික හා දාර්ශනික සංකල්පනාවන්හි සමෝධානය විෂයෙහි පූජා චාරිත්‍ර විධීන්හි බලපෑම නිර්ණය කර ගත හැකි වීම,

7. බෞද්ධ චින්තාගත සුඛනම්‍ය ආගමික පිළිවෙත සමර්ථනය කිරීම,

ආදිය මෙම පර්යේෂණයේ වැදගත්කම වේ.

පාදක සටහන්

1. කරුණාරත්න, ඩබ්ලිව්. එස්., 1987, 11 පි.

2. ඛුනි. **ii**, පබ්බජ්ජා සූත්‍රය, 402 පි.

"සම්බාධො'යං ඝරාවාසො රජස්සායතනං ඉති

අබ්භොකාසො'ව පබ්බජ්ජා ඉති දිස්වාන පබ්බජි".

3. දීනි. **i**, සීලක්ඛන්ධ වග්ග, 110 පි.

4. ධප., 203 ගා.

"ජිගච්ඡා පරමා රොගා - සංඛාරා පරමා දුඛා

එවං ඤත්වා යථා භූතං - නිබ්බාණං පරමං සුඛං".

# නිබන්ධ සාරාංශය

මෙම නිබන්ධයෙහි හැඳින්වීම පිළිබඳ කොටසින්, සමස්ත පර්යේෂණයේ අරමුණු, විෂය ක්ෂේත්‍රය, ක්‍රමවේදය, අධ්‍යයනයේ වැදගත්කම යන කරුණු පිළිබඳව සාකච්ඡා කෙරේ. සාහිත්‍යයික මූලාශ්‍රය පිළිබඳ කොටසේ දී මෙම නිබන්ධය සම්පාදනය කිරීමේ දී, උපයෝගි කර ගන්නා ලද ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පිළිබඳ කරුණු සාකච්ඡා කෙරේ.

මෙම නිබන්ධයේ පළමු වැනි පරිච්ඡේදය අප නම් කළේ, 'සාහිත්‍යයික මූලාශ්‍රය විමර්ශනය' යනුවෙනි. මෙහි දී අපගේ අධ්‍යයනයට අදාළ මූලාශ්‍රය වර්ග, ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වා ඇත. මෙහි ප්‍රාථමික මූලාශ්‍රය ලෙස හඳුන්වන ලද්දේ, ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට හා විනය පිටකයට අයත් ග්‍රන්ථයන් ය. මේ මූලාශ්‍රය වර්ග දෙක අතරින් වඩාත් ප්‍රමුඛ මූලාශ්‍රය වන්නේ, ප්‍රාථමික මූලාශ්‍රය වර්ගය යි. මෙම මූලාශ්‍රය වර්ගය අපගේ අධ්‍යයනයට ඉවහල් වන ආකාරය මෙම පරිච්ඡේදය ආරම්භයේ දී ම පැහැදිලි කර දී ඇත. මෙම අධ්‍යයනයට ඉවහල් කොට ගත් ද්විතීයික මූලාශ්‍රය ලෙස සැලකෙන්නේ, අට්ඨකථා, කෝෂ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපිලේඛන ආදිය යි. මේවා අතුරින් අපට ඉතා වැදගත් වන ද්විතීයික මූලාශ්‍රය වන්නේ, අට්ඨකථාවන් ය. මේවා පශ්චාත්කාලීන බුදු දහමෙහි පූජා චාරිත්‍ර විධි වර්ධනය වූ ආකාරය විමසා බැලීමට ඉවහල් වන අයුරු පැහැදිලි කර ඇත. බුදු සමයෙහි හැඩගැසුණු පුද-පූජාවල විකාශය වටහා ගැනීමට කෝෂ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි ලේඛන අපේ අධ්‍යයනයට ඉවහල් වන ආකාරය ද මෙහි දී පැහැදිලි කර ඇත.

මෙම නිබන්ධයේ, දෙ වැනි පරිච්ඡේදය අප වෙන් කෙළේ, 'ආගම හා පූජා විධි' වෙනුවෙනි. සමස්ත පර්යේෂණයට ආමුඛයක් ලෙස දැක්විය හැකි මෙම පරිච්ඡේදයේ දී ආගම නමැති ප්‍රපඤ්චයත්, එහි අනිවාර්ය අංගයක් වූ පුද-පූජා චාරිත්‍ර ධර්ම ආදියත් පිළිබඳ මූලික වශයෙන් ම විමසා බැලේ. ආගම නමැති ප්‍රපංචය පූජා විධි සමග අත්‍යන්තයෙන් බැඳී සිටින්නක් බව අපි මෙහි දී පැහැදිලි කළෙමු. පූජා විධි සංකල්පය හැම ආගමක ම අනිවාර්ය අංගයක් බවට පත් ව ඇති ආකාරයත්, පූජා විධි සංකල්පය පිළිබඳ බෞද්ධ ආකල්පයත්, සමස්තයක් වශයෙන් ගෙන විමසා බැලීමට මෙහි ලා උත්සාහ කළෙමු.

මෙහි තෙ වැනි පරිච්ඡේදය සූත්‍ර පිටකයෙහි පැනෙන 'අන්‍ය සාමයික ඇදහිලි, පූජා චාරිත්‍ර විධි හා ඒවා පිළිබඳ බෞද්ධ විචාරය, සංශෝධන හා නව්‍යතම අර්ථකථන' යනුවෙන් නම් කොට ඇත. වෛදික හා බ්‍රාහ්මණ ආගමික දේව සංකල්පය, යාග-හෝම, අග්නි පූජා, ශ්‍රාද්ධ, පිතෘ පූජා ආදී පූජා චාරිත්‍ර විධි පිළිබඳව හා ඒවා සම්බන්ධයෙන් බුදු දහම දැක්වූ ප්‍රතික්‍රියා, ප්‍රතිශෝධන, සංශෝධන හා නව අර්ථකථන ආදිය මෙහි දී පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය කරන ලදි.

සිව් වැනි පරිච්ඡේදය 'පැවිදි සංස්ථාව හා තදනුබද්ධ පූජා චාරිත්‍ර ධර්ම' පිළිබඳ සූත්‍ර හා විනය පිටකාගත කරුණු අධ්‍යයනය කරන්නකි. මෙහි දී ලෞකික ජීවිතය අත් හැර ගෘහස්ථ බන්ධනවලින් මිදී, කසාවත් හැඳ, පැවිදි බිමට පත් ව, ලෞකික ආසාවන්ගෙන් දූරස්ථ ව, බ්‍රහ්මචාරී ජීවිතය තුළින් නිවන් පසක් කර ගැනීමට සිත් යොමු කළ භික්ෂූන්, මුල් කාලයේ දී සාමූහික වත්-පිළිවෙත් හා පූජා චාරිත්‍රයන්ගෙන් ඈත් ව සිටි ආකාරය මුලින් ම විමසීමට ලක් කරනු ලැබ ඇත. ඉන් අනතුරුව 'ආරාම' කේන්ද්‍ර කොට ගත් සංකීර්ණ සංවිධාන ක්‍රමයකට භික්ෂූන් වහන්සේලා ප්‍රවිෂ්ට වූ ආකාරයත්, එහි ප්‍රතිඵලයක් ලෙස පබ්බජ්ජා, උපසම්පදා, උපෝසථ, පාතිමොක්ඛ දෙසනා, පවාරණ කඨින ආදී විවිධ-විචිත්‍ර ප්‍රපංච රැසක් ප්‍රභවය වූ ආකාරයත්, තදායත්ත පූජා-චාරිත්‍ර ධර්ම රාශියක් කරළියට පිවිසි ආකාරයත් පිළිබඳ විචාරාත්මක හා තුලනාත්මක විමර්ශනයක් සිදු කෙරේ.

පස් වැනි පරිච්ඡේදය 'ගෘහස්ථ සංස්ථාව ආශ්‍රිත ව පහළ වූ වත් පිළිවෙත් හා පූජා චාරිත්‍ර' යනුවෙන් නම් කර ඇත. බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කරන භික්ෂූන්ට මෙන්, සංකීර්ණ වූ ජීවිතයක් ගත කරන කාමභෝගී ගිහි ජනතාවට බෞද්ධ විමුක්ති මාර්ගයට අදාළ පිළිවෙත් සමුදාය සපුරා ලීම තරමක් දුෂ්කර කාර්යයක් වන හෙයින් ඔවුන්ගේ ලෞකික අපේක්ෂා සමෘද්ධියට ගැලපෙන පරිදි, සරල ප්‍රතිපදා මාර්ගයක් නිර්දේශ කළ ආකාරය මෙහි දී සලකා බැලේ. බෞද්ධ චින්තාගත සංසාර - කර්ම - පුනර්භව - නිර්වාණ යනාදි සංකල්ප හා සබැඳි 'ආනුපුබ්බී කථා' නමින් ප්‍රකට දේශනා ක්‍රමය ඍජු ලෙස ම ගිහි අනුගාමිකයන්ගේ අපේක්ෂා සමෘද්ධිය විෂයෙහි උපයුක්ත වන ආකාරය මෙහි දී විශේෂයෙන් විග්‍රහ කෙරේ. ඒ හැරත් ගිහි ශ්‍රාවක-ශ්‍රාවිකාවනට පින් රැස්කිරීම සඳහා දාන පූජා, චෛතිය පූජා, ධාතු පූජා, කඨින පූජා, බෝධි පූජා ආදී පූජා විධි රැසක් ප්‍රභව වූ ආකාරයත්, එකී පූජා විධීහු ගිහි බෞද්ධ ප්‍රතිපදාවේ අනිවාර්ය අංගයක් බවට පත්වූ ආකාරයත් විමර්ශනය කිරීම මෙම පරිච්ඡේදයේ මුඛ්‍යතම අරමුණ වේ.

සය වැනි පරිච්ඡේදය 'ජනප්‍රිය බුදු දහමේ පූජා විධීන්ගේ වර්ධනය හා විකාශය' යනුවෙන් නම් කොට ඇත. මෙම පරිච්ඡේදයේ දී අප අවධානය යොමු කළේ, මුල් බුදු සමයෙහි හැඩ ගැසී සැකසුණු පුද-පූජා විධි, පශ්චාත්කාලීන ජනප්‍රිය බුදු දහමෙහි දී ගිහි බෞද්ධ ජනතාවගේ පුණ්‍ය චේතනා වඩන සංකල්ප වශයෙන් අනුක්‍රමයෙන් වර්ධනය වී ඇති ආකාරය පිළිබඳව විමසා බැලීමට ය. ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව පදනම් කොට ගෙන පශ්චාත්කාලීන ජනප්‍රිය බුදු දහමෙහි පුද-පූජා විධීන්ගේ වර්ධනය සිදුවී ඇති ආකාරය පිළිබඳව මෙහි දී පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය කොට ඇත. පුද-පූජා විධීන් ආදිතම යුගයේ පටන් ම බුදු සමයෙහි අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් විවිධ ස්වරූපවලින් විකාශයට පත් වූ ආකාරය මෙහි දී සාකච්ඡා කර ඇත. පුද-පූජා විධි, බුදුරදුන් විසින් දේශනා කරන ලද ප්‍රතිපදා මාර්ගයට සපුරා බාහිර වූ අංගයක් වුවත්, ඒවා මගින් එකී ප්‍රතිපදා මාර්ගයට පුද්ගලයා යොමු කිරීමේ පසුබිම සැකසෙන බව ද, විචිත්‍ර පූජා විධි පුද්ගලයාගේ අධ්‍යාත්මයේ පිරිපුන් බව සාක්ෂාත් කර ගැනීම සඳහා ඉවහල් වන බව ද සාකච්ඡා කර ඇත.

සත් වැනි පරිච්ඡේදය 'බෞද්ධ පූජා විධිවල ඇති ආචාර විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක පදනම' යනුවෙන් නම් කොට ඇත. මෙහි දී අප විසින් සිදු කරන ලද්දේ, ආචාර විද්‍යාව හා මනෝ විද්‍යාව පිළිබඳව සැකෙවින් හඳුන්වා දීමට උත්සාහ කිරීම හා බෞද්ධ පුද-පූජා විධිවල ආචාර විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක වටිනාකම් පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් ඉදිරිපත් කිරීම ය. බුදු සමයේ හැඩ ගැසී ඇති පූජා විධීන්හි, ආචාර විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක අගය විමසා බැලීමක් ද සිදු කරන ලදි. සෙසු ආගම්වලින් නිර්දේශිත පූජා විධි සහ බෞද්ධ පූජා විධි පිළිබඳ තුලනාත්මක විමර්ශනයක් ද මෙහි දී සිදු කෙරේ. බුදු දහම ආගමක් වශයෙන් පොදු ජනතාව අතර පැතිර යන විට කාලීන සමාජ අවශ්‍යතා සපුරා ලීම පිණිස එහි පුද-පූජා විධි පහළ වූ අයුරු මෙහි ලා වැඩිදුරටත් සාකච්ඡා කෙරේ.

සමස්ත පර්යේෂණයේ ප්‍රතිඵල විග්‍රහ කෙරෙන මෙම විමර්ශනයේ දී, සූත්‍ර හා විනය පිටකයන්හි පැනෙන පූජා චාරිත්‍ර විධීන්හි අනන්‍යසාධාරණ ලක්ෂණ විමර්ශනය කෙරෙන අතර, බෞද්ධ පූජා චාරිත්‍රයන්හි සදාචාර මනෝවිද්‍යාත්මක හා සමාජයීය අගය ප්‍රකට කෙරේ. එමගින් ගිහි-පැවිදි උභය පක්ෂයේ ම අධ්‍යාත්මික සංවර්ධනය සහ සාධුහිත සමාජ ජීවිතය සුරක්ෂිත කරලීමට ලැබෙන පිටුවහල විමසා බැලේ.